# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## දුම්කොළ බදු (සංශෝධන)

**1999 අංක 08 දරන දුම්කොළ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් 2019 නොවැම්බර් මස 07 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 ඔක්තෝබර් මස 15 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[309 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මෙම පනත 2019 අංක දරන දුම්කොළ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (1) වන උප වගන්තිය පරිච්ඡින්න කොට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ:—

“ 15(1) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ලඝු කාර්යය පටිපාටිය යටතේ පවත්වනු ලබන විභාගයකින් යම් තැනැත්තෙක් මෙම පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය කරනු ලැබ ඇති බවට තීරණය කරනු ලැබුවහොත් රේගු දෙපාර්තමේන්තුව හෝ සුරාබදු දෙපාර්තමේන්තුව විසින් රජය සතු කරනු ලැබූ භාණ්ඩවල වටිනාකම මෙන් තුන් ගුණයක දඩයක් හෝ වසර පහකට නොවැඩි වන්නා වූ දෙයාකාරයකින් එක් ආකාරයක දඬුවමකින් ද දඬුවම් පැමිණවිය යුතු ය.”.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.